# සිංහල







# අක්ෂර වින්‍යාසය

සටහන - පී ජේ කළුආරච්චි -ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය

සැකසුම - ඩබ්.ඩී.දිනේෂා ජයතිස්ස- බප /මිනු /සෙනරත් පරණවිතාන ජාතික පාසල- උඩුගම්පොළ

Copyright © e-thaksalawa.moe.gov.lk

# අක්ෂර වින්‍යාසය

- ලේඛන සිංහලයේ කිසියම් වචනයකට ව්‍යාකරණානුකූල ව නිවැරදි අකුරු නොයෙදීමෙන් අදහස වෙනස් වේ.

- නිවැරදි ව අකුරු යෙදීමෙන් නිවැරදි අදහස ගම්‍ය වේ.

- න , ණ , ල , ළ , ශ , ෂ , ස යන අකුරු නිවැරදි ව යෙදීම පිළිබඳ ව වියතුන් විසින් ඉදිරිපත් කරන ලද රීති රැසකි.

- එමෙන් ම නිවැරදි අර්ථය ලබා දීම සඳහා යෙදිය යුතු අක්ෂරය කුමක්ද යන්න පිළිබඳව ද
සැලකිනිමත් විය යුතු ය.

- අක්ෂරය වෙනස් වීමෙන් අදහස වෙනස් වී බොහෝ ගැටලු ඇති විය හැකි ය.

**පහත සඳහන් පාඨ කියවන්න.**

1. දැඩි හිරු කිරණ මුව පුරා දැවටෙද්දී ඉරිදා පොළෙහි බඩු කිරන පොඩි මාමා ගැන මට ඇති වූයේ ආඩම්බරයකි.

1. ජීවිතය ගැට ගසා ගන්නට වෙර දරන අභිකුණ්ඨික මිනිසා දරණ ගසා ගෙන සිටි නාගයා පෙට්ටියෙන් එළියට ගත්තේ ය.

මෙම වැකි දෙකෙහි කිරණ , කිරන , දරන , දරණ යන පදවල ණ සහ න යෙදෙන අන්දමත් ඒ ඒ පදවලින් ගම්‍ය වන අර්ථයත් අවබෝධ කර ගන්න.මෙසේ එක් එක් වචනයට ඒ ඒ අක්ෂරය යෙදීමට හේතු වූ කරුණු දැන ගැනීම සඳහා අක්ෂර වින්‍යාස රීති පිළිබඳ ව අවබෝධයක් ඇති කර ගැනීම වැදගත් ය.